# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2413/38 - 2024 දෙසැම්බර් මස 04 වැනි බදාදා - 2024.12.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ භාවිතය සඳහා වූ**

කාර්ය සාධන විගණන ප්‍රමිති

**2018 අංක 19 දරන ජාතික විගණන පනත**

5(2) වගන්තිය යටතේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා විගණන සේවා කොමිෂන් සභාව (මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත ලැබී ඇති අධිකාරිය ප්‍රකාරව එම කොමිෂන් සභාව විසින් සම්මත කර ඇති ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය විසින් සිදු කරනු ලබන කාර්ය සාධන විගණන සඳහා අදාළ වන කාර්ය සාධන විගණන ප්‍රමිතීන් (PASs-NAOSL) මෙහි පළ කර ඇත. මෙම ප්‍රමිතීන් 2024 දෙසැම්බර් 11 වන දින සිට ක්‍රියාත්මක වේ.

ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

2024 දෙසැම්බර් මස 22 වැනි දින,


1A - PG 6933 — 24 (2024/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උත්තරීතර විගණන ආයතනයන් සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්**

**(ISSAI - 3000) පදනම් කරගත්**

**ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ භාවිතය සඳහා වූ**

**කාර්ය සාධන විගණන ප්‍රමිති**

පෙරවදන

ජාත්‍යන්තර විගණන ප්‍රමිති, දේශීයකරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගත් විගණන සේවා කොමිෂන් සභාව, 2023 මැයි 24 දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ දී, උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය (International Organizations for Supreme Audit Institutions - INTOSAI) විසින් නිකුත් කළ උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති (International Standards of Supreme Audit Institutions (ISSAI) for Performance Auditing) දේශීය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සකස් කිරීම සඳහා කමිටුවක් පත්කිරීමට තීරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලයේ භාවිතය සඳහා වූ කාර්ය සාධන විගණන ප්‍රමිති ඒ අනුව සකස් කරන ලදී.

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානයේ වෘත්තීය ප්‍රකාශන රාමුවේ (INTOSAI Framework of Professional Pronouncement - IFPP) කොටසක් වශයෙන් එම සංවිධානය විසින් උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිත - 300 (ISSAI - 300) සහ උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිත - 3000 (ISSAI - 3000), ක්‍රියාත්මක කිරීමේ අත්පොත සහ මාර්ගෝපදේශ දෙකක් (GUID 3910 and GUID 3920) නිකුත් කර ඇත. ඉහත සඳහන් ජාත්‍යන්තර ප්‍රමිතවලට අනුකූල වන පරිදි, මෙම කාර්ය සාධන විගණන ප්‍රමිති පිළියෙළ කර ඇත.

මෙම ප්‍රමිති, ශ්‍රී ලංකා කාර්ය සාධන විගණන ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ අත්පොත සමග කියවිය යුතු ය. ප්‍රමිතීන්වල ප්‍රායෝගික පැතිකඩ පැහැදිලි කෙරෙන සටහන් එම අත්පොතෙහි ඇතුළත් වේ.

මෙම ප්‍රමිති, ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලයේ දේපළක් වන අතර බාහිර පාර්ශ්වයන් විසින් එය ප්‍රසිද්ධ කිරීම හෝ පරිහරණය කිරීම තහනම් වේ.

**උත්තරීතර විගණන ආයතනයන් සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන් (ISSAI - 3000) පදනම් කරගත්**

**ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ භාවිතය සඳහා වූ කාර්ය සාධන විගණන ප්‍රමිති**

**හැඳින්වීම**

**01 පොදු කරුණු**

(අ) රාජ්‍ය විගණනයේ වගකීම් සහගත බව, ගුණාත්මක බව සහ වෘත්තීයමය බව තහවුරු කිරීම සඳහා වෘත්තීය ප්‍රමිති හා මාර්ගෝපදේශ අත්‍යවශ්‍ය සාධකයක් වේ. ජාතික විගණන කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්ය සාධන විගණනයන්ගේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලය සඳහා වන මෙම කාර්ය සාධන විගණන ප්‍රමිති, විගණන සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

(ආ) මෙම ප්‍රමිති, ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ භාවිතය සඳහා වූ කාර්ය සාධන විගණන ප්‍රමිති වශයෙන් හඳුන්වනු ලැබේ.

(ඇ) මෙම කාර්ය සාධන විගණන ප්‍රමිති, උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතිවලට සමගාමීව පිළියෙල කර ඇත. උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිත - 300 (ISSAI - 300) සහ උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිත - 3000 (ISSAI - 3000) අනුකූල වන පරිදි මෙම ප්‍රමිති ප්‍රධාන කොටස් හතරක් වශයෙන් ව්‍යුහගත කර ඇත.

(i) කාර්ය සාධන විගණන ප්‍රමිති විෂය පථය

(ii) කාර්ය සාධන විගණන නිර්වචනය හා එහි අරමුණු

(iii) කාර්ය සාධන විගණනය සඳහා පොදු අවශ්‍යතා.
ඊට, ස්වාධීනත්වය හා ආචාර ධර්ම, අපේක්ෂිත භාවිත කරන්නන් හා වගකිව යුතු පාර්ශවයන් ඇමතීම සහ විෂය කරුණ, සහතිකවීම, විගණන ප්‍රවේශය, විගණන නිර්ණායක, විගණන අවදානම, දක්ෂතා, සන්නිවේදනය, අධීක්ෂණය, වෘත්තීයමය විනිශ්චය හා සංශයභාවය, තත්ත්වපාලනය, ප්‍රමාණවත් බව හා වාර්තාගත කිරීම යන කරුණු පිළිබඳ හැඳින්වීම ඇතුළත් වේ.

(iv) විගණන ක්‍රියාවලියේ ප්‍රධාන පියවරයන්.
විගණනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, වාර්තා කිරීම හා පසුපරීක්ෂාව යන පියවරයන් ඊට ඇතුළත් ය.

**02 අධිකාරය**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 5(2) වගන්තිය අනුව, විගණන සේවා කොමිෂන් සභාවට මෙම ප්‍රමිති නිකුත් කිරීමට බලය පැවරේ.

1 වන කොටස

**ශ්‍රී ලංකාවේ කාර්ය සාධන විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ විෂයය කාර්ය පථය**

03 (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාර රජය හෝ රජය සතු ආයතනයක් සතුව සියයට 50ක් හෝ ඊට වැඩි කොටස් හිමිකම පවතින සමාගම් ද ඇතුළත්ව සියළු රාජ්‍ය ආයතන ඒවායේ ගිණුම් ද ඇතුළත්ව විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අවසර ඇති අතර එම රාජ්‍ය ආයතන සමබන්ධයෙන් ඕනෑම ආකාරයක විගණනයක් සිදු කිරීමට නිදහස ඇත.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3(2) වගන්තිය මගින් විගණකාධිපතිවරයාගේ විෂයය පථය නිගමනය කර ඇති අතර, රාජ්‍ය ආයතන සතු අරමුදල් හා දේපළ සම්බන්ධ විචක්ෂණ කළමනාකරණය සම්බන්ධ විගණනය ද ඊට ඇතුළත් වේ.

(ඇ) උත්තරීතර විගණනය ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිත - 300 මගින් කාර්ය සාධන විගණන මූලධර්මවලට අනුකූලව හෝ ඒවා පදනම් කරගෙන බලධාරී කාර්ය සාධන විගණන ප්‍රමිති කට්ටලයක් නිර්මාණය කර ගැනීමට උත්තරීතර විගණන ආයතනවලට අවසර ලැබී ඇත.

04 කාර්ය සාධන විගණන සංකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා ඉතා පුළුල් ආකාරයේ විෂය කරුණු හා පර්යේෂණ ක්‍රම යොදා ගත හැක. ඒ අනුව, එකිනෙකට වෙනස් ආකාරයේ විගණන ප්‍රවේශයන් හැකි තරම් නම්‍යශීලී ලෙස යොදා ගැනීමට ඉඩකඩ ලැබෙන අතර විශේෂිත විෂය කරුණු සම්බන්ධයෙන් අදාළ වන මගපෙන්වීම් පූර්ණ වශයෙන් යොදා ගැනීමට ද අනුබල ලැබේ. එකිනෙක අතර ගැටුමක් ඇති නොවන්නේ නම්, මෙම ප්‍රමිති, උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති හෝ වෙනත් මූලාශ්‍ර වලින් ලබාගත් ප්‍රමිති පදනම් කරගෙන විගණනයන් සිදු කළ හැක. එවැනි අවස්ථාවන්වලදී, එම ප්‍රමිතීන් වලට හෝ, උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිත සම්බන්ධයෙන් අදාළ යොමුව සඳහන් කළ යුතුය.

05 මූල්‍ය හෝ අනුකූලතා විගණනයන් ද ආවරණය කරමින් සිදු කරන වඩා පුළුල් විගණනයක කොටසක් ලෙස කාර්ය සාධන විගණන මූලිකාංග ද ඇතුළත් විය හැක. විගණන වර්ග, එකිනෙකට අතිඡේදනය වන විටක හෝ එකිනෙක මිශ්‍ර වන විට කවර විගණන ප්‍රමිතීන් අනුගමනය කරන්නේදැයි තීරණය කිරීම සඳහා විගණකවරයා, අදාළ සියලු විගණන ප්‍රමිතීන් නිරීක්ෂණයට භාජනය කළ යුතු අතර අදාළ විගණනයේ දී පාදක කරගත යුතු මූලික අරමුණ හා වෙනත් ප්‍රමුඛතා පවතින්නේදැයි යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

2 වන කොටස

**කාර්ය සාධන විගණනය සම්බන්ධ නිර්වචන සහ එහි අරමුණු**

**06 නිර්වචනය**

රජය සතු ආස්ථිත්‍යයන්, පද්ධති, මෙහෙයුම්, වැඩසටහන්, කාර්යයන් හෝ සංවිධාන යනාදියෙහි කාර්යයන් පිරිමැසුම්භාවය, කාර්යක්ෂමතාවය හෝ ඵලදායීතාවය යන මූලධර්මවලට අනුකූලව මෙහෙයවන බව සහ අදාළ ක්‍රියාවලින් තවදුරටත් වර්ධනය කිරීම සඳහා ඉඩකඩ පවතින බව තහවුරු කර ගැනීම සඳහා සිදු කරනු ලබන ස්වාධීන, අරමුණුගත හා විශ්වාසදායි පරීක්ෂාව, කාර්ය සාධන විගණනය වේ.

**පිරිමැසුම්භාවය**

සම්පත්වල පිරිවැය අවම කිරීම, පිරිමැසුම්භාවයේ මූලධර්මයෙන් අදහස් වේ. පරිහරණය කරනු ලබන සම්පත්, හොඳම මිලට නිසි ගුණාත්මක තත්වයෙන් හා ප්‍රමාණයෙන්, නිසි කාලසීමාවක් තුළ ලබා ගැනීම මෙහිදී සිදු කළ යුතු වේ.

**කාර්යක්ෂමතාවය**

ලබාගත හැකි සම්පත්වලින් උපරිම නිමැවුමක් ලබා ගැනීම කාර්යක්ෂමතාවයේ මූලධර්මයෙන් අදහස් වේ. ප්‍රමාණය, ගුණාත්මකභාවය හා නිසි කාලය තුළ ලබා ගැනීම යන කරුණුවලට යටත්ව උපයෝජනය කරනු ලබන සම්පත් හා එහි නිමැවුම අතර පවතින සම්බන්ධතාවය මෙහිදී සලකා බලනු ලැබේ.

**ඵලදායිතාවය**

ඉලක්ක කරන ලද අරමුණු හා අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම ඵලදායීතාවය පිළිබඳ මූලධර්මයෙන් අදහස් වේ. නිමැවුම්, ප්‍රතිඵල හා පසු බලපෑමේ තීව්‍රතාවය යනාදිය සමඟ එය සම්බන්ධ වේ.

කාර්ය සාධන විගණනයක් සඳහා සම්බන්ධ වන විගණකවරයෙකු විසින් පිරිමැසුම්භාවය. කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය පිළිබඳ මූලධර්ම තහවුරු කිරීම සඳහා යම් ආස්ථිත්‍යයක් විසින් සිය ආයතනික හා නියාමන සැකසුම් හරහා අවශ්‍යයෙන්ම පිහිටුවා ඇති තත්වයන් විශ්ලේෂණය කිරීම සිදු කළ යුතු වේ. තවද, පිරිමැසුම්භාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ මූලධර්ම සමඟ අනුගත වෙමින්, අදාළ සේවාවන් නිවැරදිව හා කාලීනව සපයනු ලබන බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන මනා කළමනාකරණ පරිචයන් හා කාර්ය පටිපාටි අනුගමනය කිරීම සඳහා වූ විගණිත අස්ථිත්වය සතු සැලසුම් පිළිබඳව විගණකවරයා පළමුවෙන් ම සෑහීමකට පත් විය යුතුය.

07 අරමුණු

කාර්ය සාධන විගණනයේ අරමුණු වන්නේ රාජ්‍ය අංශය තුළ, යහපාලනය, ගිණුම කටයුතු භාවය හා විනිවිදභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන පිරිමැසුම්භාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය යන සංකල්ප වැඩි දියුණු කිරීමට දායක වීම වේ. තවද, නව තොරතුරු, විශ්ලේෂණ ක්‍රමවේද භාවිතය හා සූක්ෂමව සිදු කරනු ලබන අනාගත පුරෝකථනයන්ට දායක වීම සහ අවශ්‍ය වන පරිදි අනාගත වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනයන් සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීම ද කාර්ය සාධන විගණනය මගින් බලාපොරොත්තු වේ.

3 කොටස

**කාර්ය සාධන විගණනය සඳහා වූ පොදු අවශ්‍යතාවයන්**

**08 ස්වාධීනත්වය හා ආචාර ධර්ම**

විගණකවරයා විසින් ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය විසින් අනුගමනය කරනු ලබන ස්වාධීනත්වය හා ආචාර ධර්ම පිළිබඳ ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතු ය.

ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය කොටස් දෙකකින් යුක්ත වේ.

(අ) තත්‍ය ස්වාධීනත්වය

(ආ) දෘශ්‍යමාන ස්වාධීනත්වය

**තත්‍ය ස්වාධීනත්වය**, විගණකවරයාට සිය කටයුතු, වෘත්තීයමය විනිශ්චයන්ට අදාළ වන සම්මුතීන්ට බාධා නොවන පරිදි අවංකව, අපක්ෂපාතීව සහ වෘත්තීයමය සංශය දෘෂ්ඨිය (සැකකටයුතු භාවය) සහිතව ඉටු කරලීමට අවස්ථාව සලසා දෙයි.

විගණකවරයාගේ අවංකත්වය, අපක්ෂපාතීත්වය සහ වෘත්තීයමය සංශය දෘෂ්ඨිය පිළිබඳව සාධාරණ සැකයක් සහිතව කටයුතු කරන යම් දැනුවත් පාර්ශවයක් විසින් විගණකවරයා වෘත්තීයමය විනිශ්චයන්ට අදාළ වන සම්මුතීන්ට අනුකූලව කටයුතු කරනු ලබන බව තීරණය කිරීම දෘශ්‍යමාන ස්වාධීනත්වය යන්නෙන් අදහස් වේ.

**09 අපේක්ෂිත පරිශීලකයන් හා වගකිව යුතු පාර්ශවයන්**

විගණනය සම්බන්ධයෙන් අපේක්ෂිත පරිශීලකයන් හා වගකිවයුතු පාර්ශවයන් පැහැදිලිව හඳුනා ගැනීමට කාර්ය සාධන විගණකවරයා කටයුතු කළ යුතු ය. විගණනය සිදු කරනු ලබන කාල සීමාව පුරාම මෙම පාර්ශවයන්ගේ බලපෑම හඳුනාගෙන ඒ අනුව විගණනය මෙහෙය වීමට විගණකවරයා කටයුතු කළ යුතු ය.

විගණකවරයා සිය කාර්ය සාධන විගණන වාර්තා පිළියෙළ කර ඉදිරිපත් කිරීමට ඉලක්ක කරනු ලබන පාර්ශවය, **අපේක්ෂිත පරිශීලකයන්** වේ. පාර්ලිමේන්තුව, රාජ්‍ය ආයතන සහ විගණන වාර්තාව සලකා බැලීමට භාජනය කරනු ලබන තුන්වැනි පාර්ශවයන් හා පුරවැසියන් යනාදී සියලුම පාර්ශවයන් අපේක්ෂිත පරිශීලකයන් වශයෙන් හඳුනා ගත හැකි ය.

විගණනයට භාජනය කරනු ලබන මාතෘකාව සම්බන්ධයෙන් විවිධ ආකාරයෙන් වගකීම දරනු ලබන ආයතන හෝ පුද්ගලයින් කණ්ඩායම, **වගකිවයුතු පාර්ශවයන්** වනු ඇත. විගණනයට අදාළ විෂයයෙහි මෙහෙයුම් හෝ අධීක්ෂණ කාර්යභාරය ඉටුකරනු ලබන පාර්ශවයන් හා විගණන නිර්දේශ සලකා බලා අදාළ වෙනස් කිරීම්වලට සම්බන්ධ වන පාර්ශවයන් ද වගකිව යුතු පාර්ශවයන්ට ඇතුළත් වේ. සමහර විටක, අපේක්ෂිත **පරිශීලකයන්** හා වගකිවයුතු පාර්ශවයන් එකම පාර්ශවයක් ද විය හැකි ය.

**10 විෂයය කරුණ**

කාර්ය සාධන විගණකවරයා, කාර්ය සාධන විගණනයක් සඳහා යම් විෂය කරුණක් හඳුනා ගත යුතු ය.

**විෂයය කරුණ,** විගණන මාතෘකාව විස්තර කරයි. එය, " විගණනය කරනු ලබන්නේ කුමක්ද? යන ප්‍රශ්නය හා සම්බන්ධවන අතර විගණන විෂය පථය විස්තර කරනු ලබයි. විශේෂිත වැඩ සටහන්, කටයුතු, පද්ධතීන්, ආස්ථිත්‍යයන් හෝ අරමුදල් සහ කාර්යයන් (ඒවායේ නිමැවුම්, ප්‍රතිඵල හෝ බලපෑම් සමඟ) හෝ යම් සිදුවීමකට බලපෑ හේතු සහ ඒවායේ ප්‍රතිවිපාක ඇතුළත්ව වර්තමානයේ පවත්නා සත්‍ය තත්වයයන් යනාදිය කාර්ය සාධන විගණනයක් සම්බන්ධයෙන් විෂය කරුණු විය හැකි ය.

**විගණන විෂය පථය,** විගණන කාර්යයේ සීමාව වන අතර එය විගණන අරමුණ හා සෘජුව බැඳී පවතී. විගණන විෂය පථය මගින් විගණකවරයා විසින් අගැයීමට භාජනය කරනු ලබන හා වාර්තා කරනු ලබන විෂය කරුණ, පරීක්ෂාවට භාජනය කරනු ලබන ලිපිලේඛන හා වාර්තා, සමාලෝචනයට භාජනය කරනු ලබන කාල සීමාව සහ ඇතුළත් විය යුතු පරිශ්‍රයන් යනාදිය නිර්වචනය කරයි.

**11 කාර්ය සාධන විගණනයේ රහස්‍යභාවය හා සහතික කිරීම**

විගණන විෂය කරුණට අදාළ නිර්ණායක සහ එම නිර්ණායක පදනම් කර ගනිමින් සිදු කරන ලද, විගණනයෙන් අනාවරණය වූ ප්‍රතිඵල පිළිබඳ සහතිකය, විගණකවරයා පාරදෘශ්‍යභාවයෙන් යුතුව සන්නිවේදනය කළ යුතු ය.

**සහතික කිරීම** යන්නෙන් අදහස් වන්නේ විගණන වාර්තාවේ ඇතුළත් සොයාගැනීම්, නිගමන හා නිර්දේශ සම්බන්ධයෙන් අදාළ වාර්තාව පරිශීලනය කරන පාර්ශවයන් තුළ ඇති වන විශ්වාසදායී බව යි. විගණන නිර්ණායක, සොයා ගැනීම් හා නිගමන යනාදිය සමබරව හා සාධාරණව වැඩි දියුණු කළ ආකාරය හා විගණන සොයා ගැනීම්, නිගමන බවට පත්වීමට හේතු වූ කරුණු පැහැදිළි කිරීමෙන් විගණකවරයා වාර්තා පරිශීලකයන් වෙත සහතික කිරීමක් සිදු කරනු ලබයි.

කාර්ය සාධන විගණකවරයා විසින් නිගමනවලට එළඹී ඇත්තේ සහ ඒ අනුව නිර්දේශයන් සිදු කරන ලද්දේ වලංගු හේතුන් සහිතව හා ඒවා පදනම් කරගෙන බව කාර්ය සාධන විගණකවරයා තහවුරු කළ යුතුය. ඒ සඳහා ඔහු,

(අ) වගකිව යුතු පාර්ශවයන්ගේ වැඩ කටයුතු පිළිබඳව අපේක්ෂිත පරිශීලකයන් වෙත වලංගු හා විශ්වාසදායී තොරතුරු සපයන බව හා

(ආ) විෂය කරුණ පිළිබඳ නිගමන, විගණනයේ අරමුණ හා නිර්නායක සමඟ පවතින තර්කානුකූල සම්බන්ධතාවය ප්‍රමාණවත් හා ප්‍රවීන සාක්ෂි මගින් තහවුරු වන බව සනාථ කළ යුතු ය.

**12 විගණන අරමුණු**

පිරිමැසුම්භාවය, කාර්යක්ෂමතාවය හා / හෝ ඵලදායිතාවය පිළිබඳ මූලධර්ම සම්බන්ධ වන පරිදි පැහැදිලි ලෙස අර්ථ දක්වන ලද විගණන අරමුණු, කාර්ය සාධන විගණකවරයා සකස් කර ගත යුතු ය.

විගණකවරයා සිය විගණනයේ අරමුණු, තර්කානුකූල පදනමක් සහිතව ඉදිරිපත් කළ යුතු ය. විගණන ගැටළු සඳහා නිශ්චිත පිළිතුරු ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් විස්තර සහිතව විගණනයේ අරමුණු පැහැදිලි ලෙස ප්‍රකාශ කළ යුතුය.

**13 විගණන ප්‍රවේශය**

විගණකවරයා,

(අ) ප්‍රතිඵලවලට දිශානුගතව

(ආ) ගැටලුවලට දිශානුගතව

(ඇ) පද්ධතියට දිශානුගතව සහ

(ඇ) ඉහත සියල්ලේ මිශ්‍රණයක් වශයෙන් තම විගණන ප්‍රවේශය තෝරා ගත යුතුය.

**ප්‍රතිඵලවලට දිශානුගත** විගණන ප්‍රවේශයක් මගින් අපේක්ෂිත පරිදි ප්‍රතිඵල හෝ නිමැවුම් ලඟා කර ගත්තේ ද යන්න හා අපේක්ෂිත ආකාරයට කාර්යයන් මෙහෙයවනු ලැබුවේ ද යන්න තක්සේරු කරනු ලබයි.

**ගැටළුවලට දිශානුගත** විගණන ප්‍රවේශයක් මගින් ගැටළුවට හෝ ප්‍රශ්නයට මුල් වූ හේතු හෝ විගණන නිර්නායකවලින් බැහැර වීමට හේතු වූ කරුණු පරීක්ෂා කිරීම, තහවුරු කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරනු ලබයි.

**පද්ධතියට දිශානුගත** විගණන ප්‍රවේශයක් මගින් කළමනාකරණ පද්ධතියක යථා ක්‍රියාකාරිත්වය පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

**14. විගණන නිර්නායක**

(අ) විගණන නිර්නායක යනු විෂය කරුණු අගැයීමට භාවිතා කරනු ලබන මිනුම් ලකුණු වේ.

(ආ) කාර්ය සාධන විගණකවරයා සුදුසු විගණන නිර්නායක තීරණය කළ යුතු ය. ඒවා, විගණන අරමුණු හා විගණන ගැටළුවලට අදාළ විය යුතු අතර පිරිමැසුම්භාවය, කාර්යක්ෂමතාවය හෝ ඵලදායිතාවය යන මූලධර්ම සමඟ සම්බන්ධ විය යුතුය.

(ඇ) විගණන සැලසුම් අදියරේ දී මෙන්ම විගණනය ක්‍රියාත්මක කිරීමේ අදියරේදී ද එම අදියරයන් හි කොටසක් වශයෙන්, විගණන නිර්නායක, විගණනයට භාජනය වන පාර්ශවය සමඟ සාකච්ඡාවට භාජනය කිරීමට කාර්ය සාධන විගණකවරයා කටයුතු කළ යුතුය.

**15 විගණන අවදානම**

අසමමිතික තොරතුරු හෝ අගය එකතු කිරීමක් රහිත වැරදි හෝ අසම්පූර්ණ විගණන සොයා ගැනීම්, නිගමන හා නිර්දේශවලට එළඹීමට තිබෙන අවස්ථා වළකාලීම සඳහා වූ විගණන අවදානම කළමනාකරණය කර ගැනීමට විගණකවරයා ක්‍රියාකාරී ලෙස කටයුතු කළ යුතු ය.

ප්‍රමාණවත් හා ප්‍රවීන සාක්ෂි නොවීම, විගණන ක්‍රියාවලිය ප්‍රමාණවත් නොවීම, වංචා හෝ වරදවා දැක්වීම් හේතුවෙන් හිතාමතාම සිදු කරන මගහැරීම් හෝ වැරදි තොරතුරු සැපයීමේ ප්‍රතිඵලයක් වශයෙන් විගණකවරයාගේ සොයා ගැනීම්, නිගමන හා නිර්දේශ නිශ්චිත නොවීම හෝ අසම්පූර්ණ වීමට තිබෙන හැකියාව, කාර්ය සාධන විගණනය සම්බන්ධයෙන් **විගණන අවදානම** වේ.

**16 සන්නිවේදනය**

(අ) විගණන ක්‍රියාවලිය පුරාම විගණිත ආයතනයට හා අදාළ පාර්ශවකරුවන් වෙත විගණනයේ ප්‍රමුඛ තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා ක්‍රමවේද සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කාර්ය සාධන විගණකවරයා කටයුතු කළ යුතුය.

(ආ) පාර්ශවකරුවන් වෙත තොරතුරු සන්නිවේදනය කිරීමේ දී ජාතික විගණන කාර්යාලයේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබඳ සම්මුති කඩ නොවන බව තහවුරු කිරීමට කාර්ය සාධන විගණකවරයා සැලකිලිමත් විය යුතුය.

**17 විගණන කාර්ය මණ්ඩලයේ නිපුනතාවයන්**

(අ) කාර්ය සාධන විගණන කාර්ය මණ්ඩලය, කණ්ඩායමක් වශයෙන්, තම විගණන කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය වෘත්තීයමය නිපුණතාවයන්ගෙන් සමන්විත විය යුතුය.

(ආ) විගණන කාර්ය මණ්ඩලයේ දැනුම සම්පූර්ණ කිරීම සඳහා බාහිර විශේෂඥ සහායක් අවශ්‍ය යැයි විගණකවරයාට හැඟී යන්නේ නම්, එවැනි විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයෙකු අවශ්‍ය පරිදි, උත්තරීතර විගණන ආයතනය තුළින් ම හෝ බාහිරව ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

**18 විගණන වැඩ අධීක්ෂණය**

විගණන ක්‍රියාවලියේ එක් එක් අදියරයන්වල දී, විගණන කාර්ය මණ්ඩලයේ වැඩ කටයුතු නිසි පරිදි අධීක්ෂණය කෙරෙන බව තහවුරු විය යුතු වේ.

**19 වෘත්තීයමය විනිශ්චය හා සංශය දෘෂ්ටිය (සැකකටයුතු භාවය)**

(අ) කාර්ය සාධන විගණකවරයා වෘත්තීයමය විනිශ්චය හා සංශය දෘෂ්ටිය ක්‍රියාවට නැගිය යුතු ය. මේ සඳහා විවිධාකාර මූලාශ්‍ර තුළින් පැන නැගෙන කරුණු සැලකිල්ලට ගත යුතු අතර එකිනෙකට වෙනස් අදහස් දැක්වීම් හා තර්ක කිරීම් සම්බන්ධයෙන් විවෘත හා අපක්ෂපාතී ආකල්පයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

(ආ) කාර්ය සාධන විගණකවරයා විගණන කටයුතු සැලසුම් කිරීමේ දී වංචා පිළිබඳ අවදානම තක්සේරු කළ යුතු අතර විගණන ක්‍රියාවලිය අතරතුර වංචාවන් සිදු විය හැකි අවස්ථාවන් සම්බන්ධයෙන් අවධානයෙන් සිටිය යුතුය.

**වෘත්තීයමය විනිශ්චය** යනු විගණන ක්‍රියාවලිය සඳහා තමන් එකතු කරගත් දැනුම, දක්ෂතාවයන් හා අත්දැකීම් ක්‍රියාවට නැංවීම වේ. එය, විෂය කරුණු විගණනය කිරීම සඳහා අවශ්‍ය වන අවබෝධ කර ගැනීමේ මට්ටම තීරණය කර ගැනීමට විගණකවරයාට උපකාරී වේ.

**වෘත්තීයමය සංශය දෘෂ්ටිය** යනු ලබාගත් විගණන සාක්ෂි සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රශ්න කිරීමේ හා ඒවා විමර්ශනශීලීව තක්සේරු කිරීමේ මානසික ස්වභාවය යි. විගණන සාක්ෂි අගැයීමේ කටයුතුවල දී විගණකවරයා තම දැනුම, දක්ෂතා සහ හැකියාවන් සද්භාවයෙන් හා අපක්ෂපාතීව ඒ සඳහා යොදා ගනු ලබයි.

**20 තත්ත්වපාලන**

විගණන කාර්යයන් හි ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම සඳහා ජාතික විගණන කාර්යාලය තුළ තත්ත්වපාලන පද්ධතියක් පිහිටුවා පවත්වා ගෙන යාම අවශ්‍ය වේ. කාර්ය සාධන විගණකවරයා එම තත්ත්වපාලන පද්ධතිය සමඟ අනුගතව කටයුතු කළ යුතු අතර ඒ සඳහා සියලු අවශ්‍යතා සම්පූර්ණ කරන ලද බවටත්, සියළු විගණන ගැටළු නිරාකරණය කර ගනු ලැබූ බවටත්, අදාළ විගණන වාර්තාව අගය එකතු කරන ලද, සමබර හා සාධාරණ වාර්තාවක් බවටත් තහවුරු කළ යුතුය.

ජාතික විගණන කාර්යාලයේ තත්ත්වපාලන පද්ධතිය හා සම්බන්ධ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි අඛණ්ඩව සංවර්ධනය කර පවත්වා ගත යුතු අතර කාර්ය මණ්ඩලය වෙත නිරතුරුව සන්නිවේදනය විය යුතු ය. විගණන මතය සම්බන්ධයෙන් අධීක්ෂකයින් හා විගණන කණ්ඩායමේ සාමාජිකයින් අතර ඇතිවිය හැකි පරස්පරතා දුරලීමට එය උපකාරී වේ. ඊට අමතරව, තත්ත්වපාලන යාන්ත්‍රණයේ ඵලදායිත්වය තහවුරු කිරීම සඳහා කාර්ය මණ්ඩලය වෙත අමතර උපදෙස් සැපයීම හා සේවාස්ථ පුහුණු අවස්ථා සැලසීම ද අත්‍යවශ්‍ය වේ.

**21 ප්‍රමාණවත් බව**

උපරිම අගය එකතු කිරීමක් සඳහා වූ අරමුණින් යුක්තව, කාර්ය සාධන විගණකවරයා, අදාළ විෂය කරුණ සම්බන්ධ මූල්‍යමය, සමාජමය හා දේශපාලනමය අංශයන් ද ඇතුළත් සෑම පැතිකඩක්ම විගණන ක්‍රියාවලියේ සියලු පියවරයන්වල දී ප්‍රමාණාත්මක ලෙස සලකා බැලිය යුතුය.

කාර්යසාධන විගණනයේ දී, **ප්‍රමාණවත් බව** යන්නෙන් අදහස් වන්නේ සමාලෝචනයට භාජනය වන සන්දර්භය තුළ යම්කිසි කාරණයක පවතින සාපේක්ෂ වැදගත්කම (කැපී පෙනෙන සුළු බව) වේ.

ප්‍රමාණවත් බව යන්නට සමාජ හා දේශපාලනමය වැදගත්කම, අනුකූලතාවය, විනිවිදභාවය, පාලන ව්‍යුහය හා ගිණුම්කටයුතු භාවය මෙන්ම මූල්‍යමය අගයයන් ද ඇතුළත් වේ. ප්‍රමාණවත් බව යන්න කාලානුරූපව වෙනස් විය හැකි අතර අපේක්ෂිත පරිශීලකයන්ගේ හා වගකිව යුතු පාර්ශවයන් ගේ ආකල්පවලට යටත් වේ.

**22 වාර්තාගත කිරීම**

කාර්ය සාධන විගණකවරයා, සම්පූර්ණ කරන ලද විගණන කාර්යයන් ප්‍රමාණවත් ලෙස, විස්තරාත්මකව වාර්තාගත කළ යුතු වේ.

පහත සඳහන් කාර්යයන් ඉටු වීම සඳහා සිදුකරන ලද විගණන කාර්යයන් සම්බන්ධයෙන් කාලානුරූපව වාර්තාගත කිරීම් අවශ්‍ය වේ.

(අ) විගණන කාර්යය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාදීමට;

(ආ) විගණන කාර්යය කෙරෙහි පූර්ව අවබෝධයක් නොමැති පළපුරුදු විගණකවරයෙකුට මෙම විගණන කාර්යයේ ස්වභාවය, කාලය හා විෂය පථය හා ක්‍රියාවට නගන ලද විගණන කාර්යයන් හි ප්‍රතිඵල සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදීමට; හා

(ඇ) සියලු වැදගත් කරුණු පදනම් කරගෙන වෘත්තීමය විනිශ්චයන්ට එළඹුණු බව තහවුරු කිරීමට සහ විගණන සොයා ගැනීම්, නිගමන හා නිර්දේශ සඳහා ලබා ගත් සාක්ෂි අගැයීමට;

4 කොටස

**කාර්ය සාධන විගණන ක්‍රියාවලියට අයත් පියවරයන්**

**(අ) කාර්ය සාධන විගණනය සැලසුම් කිරීම**

**23 විගණන මාතෘකා තෝරා ගැනීම**

(අ) උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියක් තුළින් කාර්ය සාධන විගණකවරයා විගණන මාතෘකා තෝරා ගත යුතුය.

වර්ෂයකට හෝ වර්ෂ කිහිපයක් සඳහා වූ ජාතික විගණන කාර්යාලයේ මෙහෙයුම් විගණන සැලැස්ම, කාර්ය සාධන විගණනය සඳහා වූ උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය ආවරණය කරනු ලබයි. රාජ්‍ය අංශයේ වෙනස්වනසුළු ස්වභාවය සහ රාජ්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වන ප්‍රමුඛතා සලකා බලා මෙහෙයුම් විගණන සැලැස්ම වාර්ෂිකව සංශෝධනය කිරීම සාධාරණ කරුණක් වේ.

ජාතික විගණන කාර්යාලයේ කාර්ය සාධන විගණන අංශය සඳහා වූ මෙහෙයුම් විගණන සැලැස්ම, විගණන මෙහෙයුම් හා සම්පත් වෙන් කිරීම සඳහා අවශ්‍ය පදනම සපයයි. එම සැලැස්ම මගින් අදාළ විගණන ක්ෂේත්‍ර ලැයිස්තුගත කරනු ලබන අතර එම ක්ෂේත්‍රයන් තුළ උද්ගත විය හැකි ගැටළු, ප්‍රශ්නකාරී ස්ථාන හා විකල්ප මතවාද කෙටියෙන් විස්තර කරනු ලබයි. ඉහත සඳහන් ලැයිස්තුව පදනම් කර ගනිමින් විගණකාධිපතිවරයාගේ අනුමැතිය ඇතිව කාර්ය සාධන විගණනය සඳහා වූ විගණන මාතෘකා තෝරා ගැනීම, ජාතික විගණන කාර්යාලයේ කාර්ය සාධන විගණන අංශය විසින් සිදු කෙරෙනු ඇත.

(ආ) විගණන අවදානම් හා ගැටලු හඳුනා ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම මගින් කාර්ය සාධන විගණකවරයා, ඉදිරියේ දී ක්‍රියාත්මක කළ හැකි විගණන මාතෘකා පිළිබඳ විශ්ලේෂණයක් කළ යුතුය.

අවදානම් තක්සේරු කිරීම, ගැටළු විශ්ලේෂණය හා ප්‍රමාණවත්බව යන කරුණු පදනම් කර ගනිමින් විගණන මාතෘකා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත. **අවදානම** යනු ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා බලපාන සිදු විය හැකි සිද්ධීන් සහ ඒවායේ පසු බලපෑම් වේ. **ප්‍රමාණවත් බව** යන්න මූල්‍යමය කරුණු පමණක් නොව යම් නීතියක් හෝ එහි සංශෝධනයක් හේතුවෙන් පීඩනයට පත්විය හැකි පුරවැසියන්ගේ සංඛ්‍යාව, විනිවිදභාවය හා යහ පාලනය යනාදියෙන් විය හැකි සමාජමය හෝ දේශපාලනමය බලපෑම් වලට ද සම්බන්ධ වේ.

(ඇ) විගණන මාතෘකා තෝරා ගැනීමේ දී, මාතෘකාවේ වැදගත්කම, විගණනය ක්‍රියාත්මක කළ හැකි බව, විගණනය සඳහා ලැබී ඇති අධිකාරය සමඟ එකඟවීම, විගණනයෙන් අපේක්ෂිත පසු බලපෑම උපරිම කිරීම, විගණනය සම්පූර්ණ කිරීම සඳහා වූ හැකියාව සහ පූර්ව විගණන හෝ පරීක්ෂණ වල නිදේශ යනාදිය සැලකිල්ලට ගත යුතු ය.

විගණන මාතෘකා තෝරා ගැනීමේ ක්‍රියාවලියේ දී, තෝරාගනු ලබන විගණන මාතෘකා මගින් ලැබෙන ප්‍රතිලාභ, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන කටයුතු වලට, විගණිත ආයතනයට හා පොදු ජනයාට වැදගත් වන්නේ කෙසේද යන්න, ලබා ගත හැකි සම්පත් ප්‍රමාණය යනාදී කරුණු කාර්ය සාධන විගණකවරයා සැලකිල්ලට භාජනය කළ යුතු ය.

**විගණනය කළ හැකි බව,** මාතෘකාවක් විගණනය සඳහා සුදුසු ද යන්න තීරණය කරයි. අදාළ විගණන ප්‍රවේශයන් හා ක්‍රමවේද යොදා ගත හැකි බව සහ විගණන කාර්යය සඳහා නිශ්චිත කාල සීමාවක් තුළ කාර්යක්ෂම ලෙස විගණන නිර්නායක හා අනෙකුත් තොරතුරු ලබා ගත හැකි බව යන කරුණු කාර්ය සාධන විගණකවරයා සැළකිල්ලට ගත යුතු ය. කෙසේ වෙතත්, විශ්වාසදායි ලෙස තොරතුරු ලබා ගැනීමට නොහැකි බව විගණකවරයාට හැඟී යන්නේ නම් එම කරුණ ම එම මාතෘකාව විගණනය සඳහා තෝරා ගැනීමට හේතුවක් වේ.

**24 කාර්ය සාධන විගණනය සඳහා විගණන කාර්ය පටිපාටි සැලසුම් කිරීම**

(අ) විගණන අරමුණු හා ගැටලුවලට ප්‍රතිචාර වශයෙන් ප්‍රමාණාත්මක හා අදාළ සාක්ෂි රැස්කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන විගණන කාර්ය පටිපාටි, කාර්ය සාධන විගණකවරයා සැලසුම් කළ යුතු ය. මෙම කාර්යය සඳහා කාර්ය සාධන විගණකවරයා, තෝරා ගත් විගණන මාතෘකා සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා ක්‍රමානුකූල දැනුමක් විගණන සැළසුම් අදියරේදී ලබා ගත යුතු ය.

(ආ) විගණන කාර්ය පටිපාටි සැළසුම් කිරීමේ දී, ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු විගණනයක් මඟින් එම විගණන කාර්යය පිරිමැසුම් සහගතව, කාර්යක්ෂමව, ඵලදායි ලෙස හා නියමිත කාල සීමාව තුළ ඉටු කර යම් දායකත්වයක් ලබා දීමට හැකිවන පරිදි එම කටයුතු සැළසුම් කළ යුතු ය.

සීමිත කාල පරාසයක් තුළ ක්‍රියාත්මක කළ හැකි ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු විගණන කාර්යයන් සඳහා කාර්ය සාධන විගණකවරයා අදාළ කාර්ය සාධන විගණන කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් සිදු කිරීමට එනම්, විශේෂිත ඉලක්කයක් ඉටු කරලීම සඳහා සම්පත් සැළසුම් කිරීම, සංවිධානය, තහවුරු කර ගැනීම, කළමනාකරණය, මෙහෙය වීම හා පාලනය යන කරුණු සම්බන්ධ කරගනිමින් සළකා බැලීම අවශ්‍ය වේ. ව්‍යාපෘතියක් වශයෙන් කාර්ය සාධන විගණන කටයුතු කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේද හා උපාය මාර්ග සංවර්ධනය කිරීම අවශ්‍ය වේ.

විගණනය මනා ලෙස සැළසුම් කළ බවට තහවුරු කිරීම සඳහා විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමට පෙර, විගණිත ආයතනයේ ව්‍යාපාරික පරිසරය හෝ විගණනය සඳහා යොදා ගන්නා විගණන වැඩසටහන් පිළිබඳව කාර්ය සාධන විගණකවරයා විසින් ප්‍රමාණවත් දැනුමක් ලබා තිබීම අවශ්‍ය වේ. ඒ සඳහා විගණන කටයුතු ආරම්භ කිරීමට පෙර **විගණන කටයුතු පිළිබඳව පූර්ව අධ්‍යයනයක්** සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. එය, දැනුම ගොඩනගා ගැනීම, විවිධ විගණන සැළසුම් පරීක්ෂා කිරීම හා අත්‍යවශ්‍ය දත්ත ලබා ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම යන කරුණු ඇතුළත් වූ පර්යේෂණ කාර්යයකට සමාන වේ.

විගණන කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා, අදාළ විගණන සැළසුම ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරයෙකු හෝ ඊට ඉහළ මට්ටමේ වගකිවයුතු නිලධාරියෙකු වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ හෝ මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ නිලධාරීන් විසින් සමස්ත විගණන සැළසුම් පිළිබඳව මෙන්ම පසුකාලීන වෙනස්කිරීම් ඇත්නම් ඒවා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා විගණන කණ්ඩායම් සමඟ නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්වීම අවශ්‍ය වේ.

**(ආ) කාර්ය සාධන විගණනය ක්‍රියාවට නැංවීම**

**25 විගණන සාක්ෂි එක්රැස් කිරීම**

විගණන සොයාගැනීම්, විගණන අරමුණු හා විගණන ගැටලු සඳහා ප්‍රතිචාර වශයෙන් නිගමනවලට එළඹීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කාර්ය සාධන විගණකවරයා ප්‍රමාණවත් හා ප්‍රවීන සාක්ෂි රැස් කළ යුතු වේ.

විගණන සොයා ගැනීම්වල සාධාරණ භාවය විෂය දැනුමැති පාර්ශවයකට ඒත්තු ගැන්වීම සඳහා ලබා ගනු ලබන විගණන සාක්ෂි, ප්‍රමාණවත් (quantity) හා ප්‍රවීන (quality) සාක්ෂි විය යුතු වේ.

ප්‍රමාණවත්භාවය යනු විගණන නිගමන හා නිර්දේශ තහවුරු කිරීම සඳහා යොදා ගන්නා විගණන සාක්ෂිවල ප්‍රමාණය මැනීම සඳහා වූ මිණුමකි. ප්‍රවීන සාක්ෂි යන්න විගණන සාක්ෂිවල ගුණාත්මක බව හා සම්බන්ධ වේ. මේ සඳහා විගණන සාක්ෂි අදාළ, වලංගු හා විශ්වාසදායි ඒවා විය යුතු වේ.

අදාළත්වය යන්න විගණන අරමුණු හා විගණන ගැටලු සමඟ විගණන සාක්ෂිවල පවත්නා තර්කානුකූල සම්බන්ධතාවයේ හා වැදගත්කමේ ප්‍රමාණය හා සම්බන්ධ වේ. වලංගුභාවය යන්නෙන් විගණන සාක්ෂිවල අර්ථවත්භාවය හා ඇගැයීමට භාජනය වන කාරණය මැන ගැනීම සඳහා සපයනු ලබන සාධාරණ පදනමේ ප්‍රමාණය අදහස් වේ. විශ්වාසදායි බව යන්නෙන් මූලාශ්‍ර රාශියකින් ලබා ගන්නා දත්තවලින් කොතෙක් දුරට විගණන සාක්ෂි සහාය ගන්වනු ලබන්නේ ද යන්න හෝ නැවත නැවතත් පරීක්ෂාවට භාජනය කරන විට එකම නිගමනයකට එළඹීමට හැකි වීම යන්න අදහස් වේ.

**26 විගණන සාක්ෂි විශ්ලේෂණය**

විගණන සොයාගැනීම්, සකස් කරන ලද විගණන අරමුණුවලට හා විගණන ගැටලුවලට සමපාතව සහ එම විගණන අරමුණුවලට ප්‍රතිචාර වශයෙන් පවතින බව තහවුරු කර ගැනීමට කාර්ය සාධන විගණකවරයා එක් රැස් ගත් තොරතුරු විශ්ලේෂණයට භාජනය කළ යුතු වේ. නොඑසේ නම්, විගණන අරමුණු හා විගණන ගැටලු නැවත අවශ්‍ය පරිදි සකස් කර ගත යුතු වේ.

කාර්ය සාධන විගණනයේ සාක්ෂි විශ්ලේෂණ ක්‍රියාවලියට විගණන ගැටලු. ලබාගත් විගණන සාක්ෂි සහ යොදා ගත් ක්‍රමවේද යනාදිය පිළිබඳව විගණකවරයා විසින් සිදු කරන අඛණ්ඩ සළකා බැලීම් ඇතුළත් වේ. විශ්ලේෂණ ක්‍රියාවලියේ සියළු අංශයයන් එහි අත්‍යවශ්‍ය අංගය වන විගණන වාර්තාව කෙටුම්පත් කිරීමේ අවස්ථාව දක්වාම එකිනෙකට සමීපව සම්බන්ධ වේ.

**(ඇ) වාර්තා කිරීම**

**27 කාර්ය සාධන විගණන වාර්තාවේ ගුණාත්මක බව**

(අ) කාර්ය සාධන විගණන වාර්තාව පරිපූර්ණ, සරලව තේරුම්ගත හැකි, පහසුවෙන් කියවිය හැකි හා අනභිනත වාර්තාවක් විය යුතු අතර එය, නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කරන ලද වාර්තාවක් විය යුතු ය.

(ආ) කාර්ය සාධන විගණකවරයා හඳුනාගත් විගණන නිර්නායක ඒවායේ මූලාශ්‍ර සමග විගණන වාර්තාවේ දැක්විය යුතු ය.

(ඇ) විගණන වාර්තාව නිකුත් කිරීමට පෙර, එහි ඇතුළත් විගණන සොයාගැනීම්, නිගමන හා නිර්දේශ සම්බන්ධයෙන් විගණිත ආයතනයේ අදහස් දැක්වීම් සඳහා ප්‍රමාණවත් පරිදි අවස්ථාවක් ලබා දිය යුතු ය.

(ඈ) කාර්ය සාධන විගණකවරයා, විගණිත ආයතනයේ අදහස් දැක්වීම සහ ඒ අනුව විගණන වාර්තාවේ අඩංගු වූ කරුණු වෙනස් කිරීම් හා ඒවා සිදු කිරීමට හේතු හෝ විගණිත ආයතනයේ අදහස් දැක්වීම් ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු යනාදිය වාර්තා ගත කළ යුතු ය.

(ඉ) කාර්ය සාධන විගණන වාර්තාවේ පිටපත් පුළුල් ලෙස ලබා ගැනීමට හැකිවන හෙයින් විගණන වාර්තාවේ ඇතුළත් රහස්‍යමය තොරතුරු සම්බන්ධ රෙගුලාසි සළකා බැලීම අවශ්‍ය වේ.

විගණන වාර්තාවේ පරිපූර්ණත්වය තහවුරු කිරීම සඳහා අදාළ විෂය කරුණු, නිගමන හා නිර්දේශ අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් විස්තර ද සහිතව විගණන අරමුණු හා ගැටලු ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය සියලු මතවාද හා තොරතුරු ඇතුළත් විය යුතු ය.

සරලව තේරුම්ගත හැකි විගණන වාර්තාවක් සඳහා අදාළ කරුණු තර්කානුකූල පදනමක් මත ගොඩනැගිය යුතු අතර විගණන අරමුණු හා ගැටළු, විගණන විෂය කරුණු, නිගමන සහ නිර්දේශ අතර පැහැදිලි සම්බන්ධතාවයක් තිබිය යුතු ය.

පරිශීලකයාට විගණන වාර්තාව පහසුවෙන් තේරුම්ගැනීම සඳහා පැහැදිලි හා නිරවුල් ලෙස භාෂාව යොදා ගත යුතු ය.

අනභිනත කාර්ය සාධන වාර්තාවක් සඳහා එහි ඇතුළත් දෑ හා ආමන්ත්‍රණය කරන ආකාරය අපක්ෂපාති විය යුතු ය. කාර්ය සාධන විගණකවරයා විගණන වාර්තාවේ පෙන්වා දෙන ගැටළුවල ස්වභාවය හා ඊට බලපෑ හේතු සහ ඒවා නොවිසඳී තිබීමේ ප්‍රතිවිපාක විස්තර කළ යුතුය. විගණනයෙන් මතු කරනු ලබන ගැටලුවේ වැදගත්කම අවබෝධ කර ගැනීමට වාර්තාවේ පරිශීලකයාට ඉන් පහසුවක් සැළසේ.

ආස්ථිත්වයේ කළමනාකරණයට, රජයට, ව්‍යවස්ථාදායකයට හා අනෙකුත් උනන්දුවන පාර්ශවයන්ට පරිහරණය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි වන පරිදි විගණන වාර්තාව නිශ්චිත කාල සීමාවක් තුළ නිකුත් කළ යුතුය.

**28 නිර්දේශ**

විගණනයේ දී හඳුනාගත් දුර්වලතා සහ ගැටලු ආමන්ත්‍රණය කිරීම මගින් සැළකිය යුතු දායකත්වයක් ලබා දීම සඳහා කාර්ය සාධන විගණකවරයා තම නිර්දේශ, නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කළ යුතු ය.

නිර්මාණාත්මක නිර්දේශයන්, මනා පදනමක් සහිතව ගොඩනගන ලද, අගය එකතු කළ ප්‍රායෝගික සහ විගණන අරමුණු, සොයාගැනීම් හා නිගමන සමග එකිනෙකට සම්බන්ධතාවයක් සහිත ඒවා විය යුතු ය. නිර්දේශ මගින් ගැටලුවලට හේතු වූ කරුණු ආමන්ත්‍රණය කළ යුතු අතර කළමනාකාරිත්වයේ වගකීම් අතික්‍රමණය නොකළ යුතු ය. යහපත් කාර්ය සාධනයක් සඳහා එම නිර්දේශ

දායකත්වයක් දක්වන ආකාරය පැහැදිලි විය යුතු ය. නිර්දේශ, තර්කානුකූල හා විශ්ලේෂණාත්මක කරුණු හා තර්ක මත පදනම් විය යුතු ය. විගණන වාර්තාවේ ඇතුළත් වැදගත් කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් විය හැකි විවිධ අදහස් දැක්වීම් සළකා බැලීමට සහ වඩා සාධාරණ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා හැකි වන පරිදි, අදාළ නිර්දේශ අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර අදාළ විගණන සොයා ගැනීම් හා ඒ මත එළඹි නිගමන ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට විගණන කණ්ඩායම් කටයුතු කළ යුතු ය.

**29 කාර්ය සාධන විගණන වාර්තා ප්‍රසිද්ධ කිරීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 13 වැනි වගන්තිය අනුව, ජාතික විගණන කාර්යාලය සෑම වර්ෂයක් තුළ ම සිදු කරන කාර්ය සාධන විගණනයන් පිළිබඳ විගණන වාර්තා, පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු අතර ඒවා, ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවිය මගින් කළ යුතු ය.

**30 පසු පරීක්ෂා පියවරයන්**

(අ) කාර්ය සාධන විගණකවරයා. ඉකුත් විගණන සොයාගැනීම් සහ නිර්දේශ පිළිබඳව ප්‍රමාණවත් පරිදි පසු පරීක්ෂා පියවරයන් අනුගමනය කළ යුතු ය.

(ආ) විගණිත ආයතනය, ප්‍රමාණවත් පරිදි ගැටලු ආමන්ත්‍රණය කළ බව හා සාධාරණ කාල සීමාවක් තුළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව කාර්ය සාධන විගණකවරයාගේ පසු පරීක්ෂාවට විය යුතු ය.

(ඇ) විගණකාධිපතිවරයා ඉදිරිපත් කරන කාර්ය සාධන විගණන වාර්තා පරීක්ෂාවට ලක් කරනු ලබන පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභා වන රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත, අදාළ සියළු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග, නිගමන හා ඒවායේ පසු බලපෑම් ද ඇතුළත්ව කරුණු වාර්තා කිරීමට ජාතික විගණන කාර්යාලය පියවර ගත යුතු ය.

පසු පරීක්ෂා පියවරයන් යනු කාර්ය සාධන විගණනයක ප්‍රතිඵල පදනම් කරගෙන විගණිත ආයතනය හෝ වෙනත් පාර්ශවයක් විසින් ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සිදු කරන කාර්ය සාධන විගණකවරයාගේ පරීක්ෂාවන් වේ. එය, ආයතනික ක්‍රියාවලින් කෙරෙහි විගණනය තුළින් කළ හැකි බලපෑම ශක්තිමත් කිරීම තුළින් හා අනාගත විගණන කාර්යයන්වල වර්ධනය සඳහා පදනමක් සැපයීම මගින් විගණන ක්‍රියාවලියේ වටිනාකම ඉහළ නංවනු ලබන ස්වාධීන කාර්යයක් වේ.

පසු පරීක්ෂා පියවරයන් මගින් විගණන වාර්තා සහ විගණන සොයා ගැනීම බරපතල ලෙස සළකා ක්‍රියා කිරීමට විගණිත ආයතන හා විගණන වාර්තා පරිශීලකයින් දිරිගන්වනු ලබන අතර කාර්ය සාධන දර්ශක අනුගමනය කිරීම සඳහා ඵලදායි ආදර්ශ සපයනු ලබයි. විගණිත ආයතනවල අභ්‍යන්තර අධ්‍යයනය හා සංවර්ධන කටයුතු සඳහා ද පසු පරීක්ෂා පියවරයන් වැදගත් වේ.

පසු පරීක්ෂා පියවරයන්, අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් සීමා නොවන අතර එමගින් විගණිත ආයතනය, ප්‍රමාණවත් පරිදි ගැටලු ආමන්ත්‍රණය කළ බව හා සාධාරණ කාල සීමාවක් තුළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව අවධානයට ලක් කරනු ලබයි.

EOG 12 - 0046

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.